www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# "මානවහිතවාදී" වෙස් මුහුනට මුවාවී එක්සත් ජනපද මැරයින් භටයෝ ශ්‍රී ලංකාවට ගොඩ බසිති

**Under the guise of "humanitarianism", US marines land in Sri Lanka**

**කේ. රත්නායක විසිනි**
**2005 ජනවාරි 12**

දිවයිනේ පුලුල් ප්‍රදේශ ගනනාවක් විනාශ කල දෙසැම්බර් 26 සුනාමියෙන් පසුව සහන මෙහෙයුම්වල යෙදීම පිනිස 200ක පමන එක්සත් ජනපද භට පිරිසක් දැන් ශ්‍රී ලංකාවට ගොඩ බැස සිටී. දැනටමත් දකුනේ ගාලු නගරයේ සිටින භට කන්ඩායමක් සමග එක්වූ තවත් සොල්දාදුවන් 100ක කන්ඩායමක්, බුල්ඩෝසරයක්, ට්‍රක් රථ සහ තවත් බර ආම්පන්න ද සහිතව යූඑස්එස් දුලුත් නෞකාවෙන් පැමින සඳුදා කොග්ගල අසලින් වෙරලට ලඟා විය.

මෙම හමුදා මැදිහත්වීම මුලුමනින් ම මානවහිතවාදී අරමුනු වෙනුවෙන් යයි වොෂිංටනය හා කොලඹ යන පාලන තන්ත්‍රයන් දෙක ම අවධාරනය කරයි. එහෙත් ශ්‍රී ලංකාවේ, ඉන්දුනීසියාවේ හා විපතට පත් සෙසු රටවල එක්සත් ජනපද මිලිටරිය යෙදවීමේ සැබෑ ගාමකය වන්නේ ඇමරිකානු ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා වැඩි දියුනු කර ගැනීම ය.

දෙසැම්බර් 26 ව්‍යසනයට එක්සත් ජනපදය දැක්වූ නිල ප්‍රතිචාරයෙන් ප්‍රකාශයට පත් වූයේ, විපතට පත් වූවන් සම්බන්ධයෙන් එක්සත් ජනපද පාලක කව තුල පවත්නා නොතැකීම සහ පිලිකුල යි. ඇත්ත වසයෙන් ම දින තුනක් තිස්සේ ජනාධිපති බුෂ් කිසිදු ප්‍රකාශයක් කලේ නැත. අවසානයේ ප්‍රකාශයක් නිකුත් කිරීමට බල කෙරුනු කල, ඔහු එක්සත් ජනපදය ආරම්භයේ දී පොරොන්දු වූ ආධාර ප්‍රමානය වන ඩොලර් මිලියන 10 ඩොලර් මිලියන 35 දක්වා වැඩි කලේ ය. පසුව අකැමැත්තෙන් යුතුව, සමස්ත මුදල අවසානයේ ඩොලර් මිලියන 350 දක්වා ඉහල දැමුනි.

ශ්‍රී ලංකාවට එක්සත් ජනපද මිලිටරිය එවීමේ යෝජනාව කෙරුනේ එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොලින් පවෙල් ජනවාරි 1 දා ශ්‍රී ලංකා විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර්ට දුරකතනයෙන් කතා කල විට දෙදෙනා අතර ඇති වූ දුරකතන සංවාදයක් තුල දී ය. එදින ම අපර භාගයේ දී, ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලන්ටඩ් නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ රටේ සහන කටයුතුවල යෙදීම පිනිස 1,500ක එක්සත් ජනපද මැරයින් භට කන්ඩායමක් එවන බව යි.

මෙම තීන්දුව ද එම තීන්දුව කරා ලඟා වූ ආකාරය ද ශ්‍රී ලංකාවේ පාලක කව තුල නොසන්සුන්තාවක් අවුලුවා ලී ය. ඒ ගැන සාකච්ඡා කිරීමට කැබිනට් රැස්වීමක් නොපැවැත්වුනු අතර යෝජනාව අනුමත කරනු පිනිස පාර්ලිමේන්තුව රැස් කලේ ද නැත. එහෙත් 1948 නිදහසෙන් පසුව ප්‍රථම වතාවට, සැලකිය යුතු එක්සත් ජනපද හමුදා කන්ඩායමක් ශ්‍රී ලංකා භූමිය වෙත පැමිනීමට නියමිත විය.

ජනවාරි 6 දා *ඩේලි මිරර්* පත්‍රයේ පල වූ කතුවැකියක් සමහර උත්සුකතා මතු කලේ ය. "ඔලුවෙන් හිතනවාට වඩා හදවතින් හිතන, භූගෝලීය භූ-දේශපාලනික අර්ථයෙන් හා න්‍යාය පත්‍රය පිටුපස පවතින න්‍යාය පත්‍රයන්ගේ අර්ථයෙන් ඇති විය හැකි දිගු-කාලීන ප්‍රතිවිපාක වෙනුවට සමහර කෙටි කාලීන වාසි ගැන වැඩි අවධානය යොමු කරන" ප්‍රවනතාවට විරුද්ධව එම කතුවැකිය අනතුරු ඇඟවී ය.

මධ්‍යම ආසියාවේ හා මැද පෙරදිග සිය මිලිටරි මෙහෙයුම් සඳහා පාදක මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව, විශේෂයෙන් ම ත්‍රිකුනාමල වරාය, යොදා ගැනීමේ එක්සත් ජනපද අභිලාෂයන් වෙත එම පුවත්පත අවධානය යොමු කලේ ය. "මෙම පසුබිම මත ගත් කල, ඇමතිවරුන් දෙදෙනා අතර දුරකතනයෙන් ඇති කර ගැනුනු අවබෝධයක පදනම මත යුද නෞකාවක් ද සහිතව එක්සත් ජනපද භටයන් යෙදවීම පිලිබඳව ප්‍රශ්න මතු වෙමින් පවතී." යයි එය අදහස් දැක්වී ය.

දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සහන වැඩ කටයුතු තුල මොනයම් හෝ එක්සත් ජනපද මිලිටරි මැදිහත් වීමකට සිය විරුද්ධත්වය පල කොට ඇත. එල්ටීටීඊ ප්‍රකාශකයෙකු මාධ්‍යවලට පැවසුවේ, ඇමරිකානු හා ඉන්දියානු හමුදා "සිය දේශපාලන හා මිලිටරි අවශ්‍යතා මත පදනම්ව", ඔත්තු බැලීමේ යෙදී එල්ටීටීඊය විනාශ කරනු සඳහා කොලඹ ආන්ඩුවට ඔත්තු සැපයිය හැකි බව යි. එම දෙරට ම එල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස දිගට ම සලකයි.

මෙම විරුද්ධත්වයන් මගින් පිලිඹිබු වන්නේ, එක්සත් ජනපද න්‍යාය පත්‍රය ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූවේ විවිධ ස්ථරවල අවශ්‍යතා සමග ගැටෙනු ඇති බවට පවත්නා උත්සුකතාවන් ය. එක්සත් ජනපද මිලිටරිය නිර්ලජ්ජී ලෙස වැලඳ ගැනීමක්, කලාපය තුල අධිරාජ්‍යවාදයේ කොල්ලකාරී ක්‍රියාවන්ට විරුද්ධ වීමේ දිගු කාලීන ඉතිහාසයක් පවතින වැඩ කරන ජනතාවගේ

විරෝධයට තුඩු දිය හැකි ය යන්න ගැන ද භීතියක් පැවතුනි.

මෙම නොසන්සුන්තාව නිසැකව ම එක්සත් ජනපද මිලිටරි මෙහෙයුමෙහි පරිමාව පහල දැමීමට තුඩු දී ඇති සාධකවලින් එකක් විය. ගාල්ලට මැරයින් භටයන් 1,300ක් ගොඩ බැස්වීමට සූදානම්ව, ට්‍රැක්ටර්, ට්‍රක් රථ සහ ගොඩබිමට බැස්සවිය හැකි දැවැන්ත යාත්‍රා තුනක් ද රැගෙන පැමිනි යූඑස්එස් බොන්හොම් යුද නෞකාව, ජනාවාරි 5 දා ඉන්දුනීසියාවේ සහන සේවාවන්ට එක් වනු පිනිස වහා ම හරවා යවන ලදි. ශ්‍රී ලංකා ආන්ඩුව සිය අදහස වෙනස් කර ගෙන එක්සත් ජනපද යෝජනාව ප්‍රතික්ෂේප කර ඇතැයි සමහර මාධ්‍ය වාර්තා පල වීමට මෙම තීන්දුව වහා ම තුඩු දුනි.

එය එසේ නොවන බව ඉක්මනින් ම පැහැදිලි විය. එක්සත් ජනපදය සිය සැලසුම ඉදිරියට ගෙන යාමට අධිෂ්ඨාන කර ගෙන සිටින බව පසුගිය සිකුරාදා සිය කොලඹ සංචාරය තුල දී, පවෙල් අවධාරනය කලේ ය. "අපි දිගු කාල පරිච්ඡේදයකට මෙහි සිටිනු ඇත.... අපගේ මිලිටරි හමුදා කලාපය තුල සිටී. ඔවුන් කොපමන කලක් රැඳී සිටිනු ඇතිදැයි මට කිව නො හැකි ය. නිසි පරිදි සිදු කල යුතු තවත් මෙහෙයුම් පවතී." කෙසේ වෙතත්, අඟහරුවාදා වන විට, එක්සත් ජනපද මැදිහත්වීමෙහි පරිමාව මැරයින් භටයන් 1,500 සිට 300 දක්වා අඩු කර තිබුනි.

භට කන්ඩායමේ ප්‍රමානය කුමක් වුවත් එහි එල්ලයන් පැහැදිලි ය. බුෂ් පාලනාධිකාරය සම්බන්ධයෙන් ගත් කල, සහන මෙහෙයුම වැදගත් පූර්වාදර්ශයක් තහවුරු කරන අතර, දිවයිනේ වඩා දිගු කාලීන ඇමරිකානු මිලිටරි මැදිහත්වීමකට පවත්නා විරුද්ධත්වය බිඳ දමනු පිනිස ද එය යොදා ගැනෙනු ඇත.

සමස්තයක් වසයෙන් ගත් කල, ඉන්දුනීසියාවට, තායිලන්තයට හා ශ්‍රී ලංකාවට "උදව් කරනු" පිනිස දැවැන්ත යූඑස්එස් ඒබ්‍රහම් ලින්කන් යුද නෞකාව මෙන් ම, යුද ගුවන් යානා, හෙලිකොප්ටර් යානා ද ඇතුලුව යුද නෞකා 20ක් ද 13,000කට අධික භට පිරිසක් ද දකුනු ආසියානු මුහුදු සීමාවට එවා තිබේ. එය වනාහි 1975 වියට්නාම් යුද්ධය අවසන් වීමෙන් පසුව කලාපයට සිදු කල විශාලත ම එක්සත් ජනපද මිලිටරි මැදිහත්වීම යි.

වොෂිංටනයට දිගු කලක් තිස්සේ සිය මූලෝපායික මැදහත්වීම යලි තහවුරු කර ගැනීමේ අභිලාෂයන් පැවතුනි. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" ධජය යටතේ, බුෂ් ආන්ඩුව ඇෆ්ඝනිස්ථානය හා ඉරාකය යටත් කර ගෙන පමනක් නො ව, ඉන්දියාව සමග සමීප මූලෝපායික සබඳතා සහ පිලිපීනය හා සෙසු රටවල් සමග මූලෝපායික සැපයුම් සංවිධානය කිරීමේ එකඟතාවන් වර්ධනය කර ගැනීම ඇතුලුව, දකුනු ආසියාව පුරා සිය මිලිටරි සම්බන්ධතා ශක්තිමත් කර ගෙන ද ඇත.

එහෙත් ප්‍රතිරෝධයන් මතු වී තිබේ. 2002 ජූනි මස දී, බුෂ් ආන්ඩුව ශ්‍රී ලංකාවේ එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව සමග "ලබා ගැනීම සහ හරස් සේවාවන් පිලිබඳ ගිවිසුමක්" අත්සන් කිරීමට උත්සාහ කලේ ය. එම ගිවිසුම මගින් එක්සත් ජනපද සන්නද්ධ හමුදාවන්ට දිවයිනේ ගුවන් තොටුපලවලට, වරායවලට සහ ගුවන් සීමාවට ප්‍රවිෂ්ට වීමේ පුලුල් ඉඩකඩක් ලබා දීමට නියමිත විය. කෙසේ වෙතත්, කොලඹ ආන්ඩුව ඒ සම්බන්ධයෙන් පැකිලෙන්ට පටන් ගත් අතර ගිවිසුම අත්සන් නො කෙරුනි.

පසුගිය වසරේ දී, "ත්‍රස්තවාදී" තර්ජනයට එරෙහිව සටන් වැදීමේ නාමයෙන්, වොෂිංටනය මූලෝපායික මලක්කා සමුද්‍ර සන්ධියේ නිත්‍ය නාවික මුර සංචාර සැලැස්මක් ක්‍රියාවට දැමීමට යෝජනා කලේ ය. ලොම්බක් සමුද්‍ර සන්ධිය සමග එකට ගත් කල, මෙම සාගර මාවත, පර්සියන් බොක්කේ සිට ජපානයට, දකුනු කොරියාවට හා චීනයට ප්‍රවාහනය කෙරෙන තීරනාත්මක තෙල් සැපයුම් ද ඇතුලු ලෝක වෙලඳාමේ හරි අඩකට ආසන්න ප්‍රමානයක් දිවෙන මාර්ගය යි. යාබද රටවල් වන ඉන්දුනීසියාව හා මැලේසියාව යන දෙරට ම, තමන්ට එවන් සහායකින් තොරව නැව් මාර්ග ආරක්ෂා කර ගත හැකැයි පවසමින්, "යෝජනාව" ප්‍රතික්ෂේප කලේ ය.

දැන්, සුනාමි ව්‍යසනයත් සමග ම, එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට සහ මලක්කා සමුද්‍ර සන්ධියට සාජුව ම යාබද ඉන්දුනීසියාවේ අසේ පලාතට ඔබ්බෙන් මුහුදු ප්‍රදේශවලට යුද නෞකා ද එම දෙරටේ ම භූමි ප්‍රදේශවලට හමුදා ද එවා ඇත.

කොලඹ පාලක කව තුල කුමනාකාර සැකයන් පැවතිය ද කිසිවෙකුත් එක්සත් ජනපද මිලිටරි හමුදා යෙදවීමට විවෘතව අභියෝග කොට නැත, හමුදා මෙහෙයුමට යටින් පවත්නා එල්ලයන් ගැන ඉඟි කිරීමට වඩා වැඩි යමක් කොට නැත. මෙම "මානවහිතවාදී" මිලිටරිය ම ඉරාක ජීවිත දස දහස් ගනනක් බිලිගෙන ඇති ඉරාකයේ නව-විජිතවාදී වාඩිලෑම බලාත්කාරයෙන් පවත්වා ගෙන යාමෙහි ලා නිමග්න වී සිටී යන පැහැදිලි සත්‍යය ගැන කිසිවෙක් සඳහන් කිරීමක් වත් කර නැත.

ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ නායකත්වයෙන් යුත් පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) සහ දක්ෂිනාංශික විපක්ෂය වන එක්සත් ජාතික පෙරමුන (එජාපෙ) යන දෙගොල්ල ම එක්සත් ජනපද හමුදා සුහදව පිලිගෙන ඇත.

එජනිස සභාගයට "වමේ" පිරිහිනු පක්ෂ — ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය (ශ්‍රීලකොප) සහ ලංකා සමසමාජ පක්ෂය (ලසසප) — ඇතුලත් ය. ශ්‍රීලකොප නායක ඩිව් ගුනසේකර සඳහන් කලේ, මේ අවස්ථාවේ දී වොෂිංටනයෙන් සහයෝගය ලබා ගැනීම සඳහන් කිරීමට තරම් වත් ගැටලුවක් නො වන බවට තම පක්ෂය විශ්වාස කරන බව යි. ලසසප ඇමති තිස්ස විතාරන තරමක වාමාංශික වේෂයක් ගනිමින්, තම පක්ෂය අධිරාජ්‍යවාදී හමුදා මැදිහත්වීමට "ප්‍රතිපත්තියක් ලෙස" විරුද්ධ වන නමුත් ඒ සම්බන්ධයෙන්

ප්‍රායෝගිකව කිසිවක් කල නො හැකි යැයි පැවසී ය.

එජනිස සභාගයේ දෙවන විශාලතම පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), රැඩිකල් හා සමාජවාදී පවා වූ වාචාල කතා සහ සිංහල ස්වෝත්තමවාදය ඇතුලත් අච්චාරුවක් ඉදිරිපත් කරමින් සිය ආනුභාවය පුලුල් කර ගෙන ඇත. අතීතයේ දී, මෙම පක්ෂයේ නායකයෝ, හිස් අධිරාජ්‍ය-විරෝධී වාග් පාඨ ගුගුරමින් විශේෂයෙන් ම තරුනයන් අතර යම් කීර්තියක් දිනා ගැනීමට සමත් වූහ. කෙසේ වෙතත්, වත්මන් තත්වයේ දී, ජවිපෙ එක්සත් ජනපද මැරයින් භටයන් ගොඩ බැසීම ගැන වචනයක් වත් කතා කර නැත.

පසුගිය දශකය මුලුල්ලේ, විශේෂයෙන් ම බුෂ් ආන්ඩුව සිය "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" දියත් කිරීමෙන් පසුව, මෙම පක්ෂ සියල්ල ම අධිරාජ්‍ය-විරෝධී පූච්චානම් ක්‍රමයෙන් අතහැර දමා ඇත. සැප්තැම්බර් 11 ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් අනතුරුව, කොලඹ දේශපාලන සංස්ථාපිතය, තමන්ගේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" එනම්, රටේ දෙමල සුලුතරයේ අයිතීන් මැඩලීමට ගෙන යන දිග්ගැසුනු සිවිල් යුද්ධයට, එක්සත් ජනපදයේ සහාය ලබා ගැනීමට උත්සාහ කර තිබේ.

මීට තිස් වසරකට ඉහත දී, වියට්නාම් යුද්ධයට එරෙහි මහජන ව්‍යාපාරයට අනුගත වීමට මෙම සියලු ම පක්ෂවලට බල කෙරුනි. ව්‍යසනයක් අවස්ථාවේ දි දිවයිනට ඇමරිකානු හමුදා ගෙන්වා ගැනීමක් ගැන එක්සත් ජාතික පක්ෂයේ (එජාප) දක්ෂිනාංශික එක්සත් ජනපද-ගැති නායකයා වූ ජේ.ආර්. ජයවර්ධනට පවා සිතා ගත නොහැකි විය. 1980 ගනන්වල දී, ඉරනවිල දැවැන්ත ගුවන් විදුලි සම්ප්‍රේශනාගාරයක් පිහිටුවීමට එජාප ආන්ඩුව ගත් තීන්දුව සැලකිය යුතු මට්ටමේ විරෝධතා අවුලුවාලී ය. අද එම පක්ෂ ම කෙඳිරිල්ලකින් වත් තොරව එක්සත් ජනපද මැරයින් භටයන් ගොඩ බැසීම පිලිගනී.

© www.wsws.org